තුන්වන වාර ඇගයීම -2016
Third Term Test - 2016
12 ශ්‍රේණිය -
Grade 12

# ගිණුම්කරණය - I
# Accounting - I

පැය දෙකකි.
Two hours

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(01) පහත සාධක අතරින් ගිණුම්කරණ පද්ධතිය මෙහෙය වීමට බලපාන සාධක වන්නේ,

(a) ලංකා ගිණුම්කරණ ප්‍රමිති (b) ගිණුම්කරණ සංකල්ප
(c) වෙළඳ පොළෙන් ලබා ගන්නා තොරතුරු (d) ගිණුම්කරණ පරිසර සාධක

(1) a සහ b පමණි. (2) a,c සහ d පමණි. (3) a,b සහ c පමණි.
(4) a,b සහ d පමණි. (5) a,b,c සහ d පමණි.

(02) තිළිණ සිල්වා සමාගම කල් බදු ක්‍රමය යටතේ රු. 5000000 මෝටර් රථයක් අත්පත්කර ගන්නා ලදී. මෙය ව්‍යාපාරයේ ගිණුම් පොත්වල වාර්තා නොකළ යුතු බව ගිණුම් ලිපිකරුගේ අදහස විය. මෙය ගිණුම් ගත කිරීමට බලපාන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

(1) මූල්‍ය මිනුම් (2) අඛණ්ඩ පැවැත්ම (3) උපචිත
(4) ගිණුම්කරණ යථාර්ථය (5) ආරක්ෂණ

(03) ණය පදනම මත මිලදී ගත් තොගයක් ගින්නෙන් විනාශ විය. මෙයට අදාල නිවැරදි ද්විත්ව බලපෑම වන්නේ,

(1) වත්කම් අඩුවේ / හිමිකම අඩු වේ. (2) වගකීම් අඩුවේ / වත්කම් අඩු වේ.
(3) හිමිකම අඩුවේ / වගකීම් වැඩි වේ. (4) වගකීම් වැඩි වේ. / වත්කම් වැඩි වේ.
(5) හිමිකම වැඩි වේ. / වත්කම් වැඩි වේ.

(04) ගැනුම් ජනලය හා විකුණුම් ජනලය අතර පවතින සමාන ලක්ෂණ වන්නේ,

(a) නැවත විකිණීමේ පරමාර්ථයෙන් මිලදී ගත් තොග සම්බන්ධයෙන් පවත්වාගෙන යයි.
(b) ණය පදනම මත සිදුවන ගනුදෙනු පමණක් ඇතුළත් කරයි.
(c) මෙහි ගනුදෙනුවලට අදාල තොගයන් මිලදී ගනු ලබන්නේ ණය පදනම මතයි.

(1) b සහ c පමණි. (2) a, b සහ c පමණි. (3) a සහ c පමණි.
(4) a පමණි. (5) a සහ b පමණි.

(05) පොදු ජනලය තුළ වාර්තා නොකරන ගනුදෙනුව වන්නේ,

(a) ආරම්භක සටහන් (b) ලී බඩු ණයට මිල දී ගැනීම. (c) බොල් ණය කපා හැරීම.
(d) තොගයක් ණයට ගැනීම. (e) දුන් වට්ටම් රු. 1000 ලද වට්ටම් ගිණුමට හර කිරීම.

(06) 2016/03/31 අවසන් වර්ෂය සඳහා රාහුල් පෙරේරා ව්‍යාපාරයෙන් උපුටා ගන්නා ලද තොරතුරු පහත දැක්වේ.

(a) දළ ලාභය රු. 426,000 කි.
(b) ව්‍යාපාරයේ විකුණුම් කරන්නේ පිරිවැය මත 30% ලාභයක් ලැබෙන පරිදිය.
(c) ව්‍යාපාරයේ අවසන් තොගය, ආරම්භක තොගයට වඩා රු. 120,000 වැඩිය.

ව්‍යාපාරයේ 2015/16 වර්ෂයේ ගැනුම්වල වටිනාකම වන්නේ,

(1) රු. 1,780,000 (2) රු. 1,966,000 (3) රු. 1,540,000
(4) රු. 1,510,000 (5) රු. 1,300,000

(07) 2015/04/01 දින යන්ත්‍ර අළුත් වැඩියාව සඳහා වැය කළ රු 340,000 යන්ත්‍ර ගිණුමට හර කරන ලදී. ව්‍යාපාරය යන්ත්‍ර පිරිවැය මත 10% ක් ක්ෂය කරනු ලබයි. ඉහත දෝෂය මගින් 2016/03/31 අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයේ ශුද්ධ ලාභයට ඇතිවූ ශුද්ධ බලපෑම වන්නේ,

(1) රු. 408000 කින් වැඩිවේ. (2) රු. 306000 කින් වැඩිවේ. (3) රු. 306000 කින් අඩුවේ.
(4) රු. 408000 කින් අඩුවේ. (5) රු. 340000 කින් අඩුවේ.

(08) පහත තොරතුරු 2016/03/31 අවසන් වර්ෂය සඳහා ජයලත් නිෂ්පාදන ව්‍යාපාරයක් උපුටා ගන්නා ලදී.

| | රු.000 |
|---|---|
| අමු ද්‍රව්‍ය ගැනුම් | 46,200 |
| සෘජු නිෂ්පාදන වැටුප් | 18,200 |
| නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය | 12,600 |
| අමු ද්‍රව්‍ය තොගයේ වැඩිවීම | 400 |
| නොනිමි තොග වැඩිවීම | 200 |

2016/03/31 අවසන් වර්ෂය සඳහා මුළු නිෂ්පාදන පිරිවැය වන්නේ,
(1) රු. 64200 (2) රු. 76800 (3) රු. 64000 (4) රු. 76400 (5) රු. 78600

(09) උණවටුන ප්‍රදේශයේ පවත්වාගෙන යන සංචාරක හෝටලයක් එම ප්‍රදේශයේ පිහිටීම තම ව්‍යාපාරයේ වත්කමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ දක්වා ඇත. මෙහිදී කඩවී ඇති ගිණුම්කරණ සංකල්ප වන්නේ,
(1) ගිණුම්කරණ ඒකක (2) ඓතිහාසික පිරිවැය (3) උපචිත
(4) මූල්‍ය විකුණුම් (5) ආරක්ෂණ

**පහත තොරතුරු 2016/03/31 න් අවසන් වර්ෂය සඳහා මර්වින් ව්‍යාපාරයෙන් උපුටා ගන්නා ලදී. එම තොරතුරු උපයෝගී කරගෙන ප්‍රශ්න අංක. 10 සහ 11 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | |
|---|---|
| 2015/04/01 ණය ගැති පාලන ගිණුම් ශේෂය | 84 300 |
| ණයට විකණුම් | 825 400 |
| ආපසු එවුම් | 43 500 |
| ලද මුදල් | 792 400 |
| පෙර වර්ෂයේ බොල් ණය නැවත ලැබීම් | 24 200 |
| ලද වට්ටම් | 18 400 |

ණයගැති පාලන ගිණුමේ ශේෂය ණයගැති ශේෂ ලැයිස්තුවේ ශේෂය සමග සමාන නොවේ. පසුව පහත වැරදි හෙළිවිය.
(1) තිළිණ විසින් ආපසු එවන ලද රු. 2400/- ඔහුගේ ගිණුමට රු. 24,000/- ක් ලෙස වාර්තා කර ඇත.
(2) සිරිපාලගේ ආරම්භක බැර ශේෂය රු. 6400/- පෞද්ගලික ලෙජරයේ හර ශේෂයක් ලෙස වාර්තා කරයි.

(10) ණයගැති පාලන ගිණුමේ 2016/03/31 දිනට ශේෂය වන්නේ,
(1) 73 800 (2) 98 000 (3) 55 400 (4) 79 400 (5) 49 600

(11) ණයගැති ශේෂ ලැයිස්තුවේ දැනට පවතින ශේෂය වන්නේ,
(1) 40 800 (2) 46 600 (3) 65 000 (4) 73 800 (5) 39 400

(12) වර්තමානයේ දී ව්‍යාපාර ඒකකය සතු කළමනාකරුගේ දක්ෂතා, සේවක කුසලතා මුදලින් තක්සේරු කර ගිණුම්ගත කරනු ලබයි. මෙම කාර්යයට අදාළ ගිණුම්කරණ සංකල්පය වන්නේ,
(1) ගිණුම්කරණ ඒකක (2) මූල්‍ය ගිණුම් (3) ගැලපුම් (4) ආරක්ෂණ (5) උපලබ්ධි

(13) පරිවර්තන පිරිවැය නිවැරදිව දැක්වෙන්නේ,
(1) මුළු නිෂ්පාදන පිරිවැය - සෘජු ද්‍රව්‍ය පිරිවැය
(2) ප්‍රාථමික පිරිවැය - සෘජු ද්‍රව්‍ය පිරිවැය
(3) නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය + සෘජු වෙනත් වියදම් + සෘජු ද්‍රව්‍ය පිරිවැය
(4) සෘජු ශ්‍රම පිරිවැය + වක්‍ර පිරිවැය - සෘජු ද්‍රව්‍ය පිරිවැය
(5) නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය + ප්‍රාථමික පිරිවැය

(14) පහත සඳහන් තොරතුරු ජය ගනිමු ක්‍රීඩා සමාජයෙන් උපුටා ගන්නා ලද තොරතුරු වේ.

| | |
|---|---|
| 2016/03/31 සමුච්චිත අරමුදල | රු. 665 000 |
| 2015/04/01 සමුච්චිත අරමුදල | රු. 690 000 |
| 2016/03/31 යාවජීව සමාජික අරමුදල | රු. 20 000 |

2015/16 වර්ෂයේ ක්‍රීඩා සමාජයේ ආදායම් හා වියදම් ගිණුමේ වෙනස වන්නේ,
(1) රු. 25 000 අතිරික්තයකි. (2) රු. 25 000 ඌනතාවයකි. (3) රු. 45 000 අතිරික්තයකි.
(4) රු. 45 000 ඌනතාවයකි. (5) රු. 20 000 අතිරික්තයකි.

(15) කපිල ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිම ක්‍රමය යටතේ සුළු මුදල් පොත පවත්වාගෙන යනු ලබයි. 2016/03/01 දිනට සුළු මුදල් පොතේ ශේෂය රු. 250 කි. පහත තොරතුරු මාර්තු මාසයට අදාළ වේ.

2016/03/01 අග්‍රිමය ප්‍රතිපූර්ණය රු. 2 500

මාර්තු මස සුළු වියදම්

| | |
|---|---|
| ගමන් ගාස්තු | රු. 300 |
| තැපැල් වියදම් | රු. 260 |
| සංග්‍රහ වියදම් | රු. 470 |
| ලිපි ද්‍රව්‍ය වියදම් | රු. 480 |

ව්‍යාපාරය විසින් අප්‍රේල් මස සිට අග්‍රිමය රු. 500 කින් වැඩි කිරීමට තිරණය කරන ලදී. 2016/03/01 දිනට අග්‍රිමය හා 2016/03/31 දිනට අග්‍රිම ප්‍රතිපූර්ණය පිළිවෙළින් දැක්වෙන්නේ,

(1) රු. 2 500 හා රු. 1 510 (2) රු. 2 750 හා රු. 2 010 (3) රු. 3 250 හා රු. 1 510
(4) රු. 2 750 හා රු. 1 510 (5) රු. 3 250 හා රු. 2 010

**සඳුන් ව්‍යාපාරයේ 2016/03/31 දිනට බැංකු පොතේ ශේෂය රු. 21,500 කි. මෙය බැංකු ප්‍රකාශය සමග එකග නොවීය. පසුව පහත වැරදි හෙළි විය. එම තොරතුරු උපයෝගී කරගෙන ප්‍රශ්න අංක. 16 සහ 17 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- ස්ථාවර නියෝග මත රක්ෂණ ගාස්තු ගෙවීම රු. 12 000 කි.
- ණය ගැති සෘජු ප්‍රේෂණ රු. 10 500 කි.
- නිෂ්කාශණය නොවූ චෙක් රු. 15 100 කි.
- ඉදිරිපත් නොවූ චෙක් රු. 12 400 කි.
- තැන්පත් කළ අගරු චෙක් රු. 3 000 කි.

(16) 2016/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි නිරූපණය කළ යුතු බැංකු ශේෂය වන්නේ,
(1) රු. 17 000 කි. (2) රු. 20 000 කි. (3) රු. 32 000 කි.
(4) රු. 29 000 කි. (5) රු. 19 000 කි.

(17) 2016/03/31 දිනට බැංකු ප්‍රකාශයෙහි ශේෂය වන්නේ,
(1) රු. 11 300 කි. (2) රු. 15 100 කි. (3) රු. 29 400 කි.
(4) රු. 17 000 කි. (5) රු. 14 300 කි.

සමන්ත ව්‍යාපාරයේ තොග සම්බන්ධ තොරතුරු පහත දැක්වේ. එම තොරතුරු උපයෝගී කරගෙන ප්‍රශ්න අංක. 18 සිට 19 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| අයිතමය | ඒකක ගණන | ඒකක පිරිවැය | ඇස්තමේන්තු ගත විකුණුම් මිල | ඇස්තමේන්තු ගත විකුණුම් වියදම |
|---|---|---|---|---|
| X | 340 | 120 | 130 | 20 |
| Y | 200 | 100 | 150 | 30 |
| Z | 300 | 150 | 150 | 30 |

(18) කාණ්ඩ ක්‍රමයට අනුව ව්‍යාපාරයේ වෙළඳ ගිණුම තුළ වාර්තා කළ යුතු තොග වටිනාකම වන්නේ,
(1) රු. 90 400 කි. (2) රු.102 800 කි. (3) රු.105 800 කි.
(4) රු.102 400 කි. (5) රු. 92 400 කි.

(19) අයිතම් ක්‍රමය අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ නිරූපණය කළ යුතු තොග වටිනාකම දක්වන්න.
(1) රු. 105 800 (2) රු. 93 400 (3) රු. 87 400
(4) රු. 92 400 (5) රු. 102 800

(20) හවුල් ව්‍යාපාරය විසින් ස්ථාවර ප්‍රාග්ධන ශේෂ ක්‍රමයක් පවත්වාගෙන යන අවස්ථාවකදී ප්‍රාග්ධන ගිණුම තුළ වාර්තා කරනු ලබන ගනුදෙනු වන්නේ,

(a) ලාභ කොටස් (b) හවුල් කරුවන්ගේ ණය සඳහා පොලිය
(c) කිර්ති නාමය ගැලපීම. (d) හවුල්කරුවෙකු විසින් ඉඩමක් යෙදවීම.
(e) ගැනිලි සිදු කිරීම.

(1) c සහ d පමණි. (2) a, b, සහ e පමණි. (3) a,c,d සහ e පමණි.
(4) a,c සහ d පමණි. (5) c,d සහ e පමණි.

(21) රන් තරු ක්‍රීඩා සමාජයේ 2015/16 වර්ෂයට අදාල තොරතුරු පහත දැක්වේ.

- 2015/04/01 ලැබිය යුතු සාමාජික මුදල රු. 12 000 කි.
- 2015/04/01 දින සාමාජිකයන් 200 දෙනෙකු සිටින අතර ඔවුන්ගෙන් මසකට රු.100 බැගින් සාමාජික මුදල් රැස්කරනු ලබයි.
- 2016/03/31 දිනට කලින් ලද සාමාජික මුදල් රු. 6000 කි
- වර්ෂය තුළදී සියලු සාමාජිකයන් සියලු මුදල් නිසි පරිදි ගෙවා ඇත.

2015/16 වර්ෂය තුළ මුදලින් ලද සාමාජික මුදල හා ආදායම් වියදම් ගිණුමට යන සාමාජික මුදල වන්නේ,

(1) රු. 240 000 හා රු. 258 000 කි.
(2) රු. 258 000 හා රු. 240 000 කි.
(3) රු. 20 000 හා රු. 38 000 කි.
(4) රු. 240 000 හා රු. 246 000 කි.
(5) රු. 20 000 හා රු. 24 000 කි.

(22) ව්‍යාපාරයක කීර්ති නාමය ගැලපීම සිදු නොකරන අවස්ථාව වන්නේ,

(1) හවුල් කරුවකු විශ්‍රාම යන විට
(2) වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට
(3) ලාභ ලාභ අනුපාතය වෙනස් වන විට
(4) නව හවුල් කරුවකු බඳවා ගැනීමේදී
(5) හවුල් ව්‍යාපාරය සමාගමක් බවට පත් කරන විට

(23) සාගර හා නදී 3:2 අනුපාතයට ලාභ බෙදා ගත් හවුල් ව්‍යාපාරයේ නව හවුල් කරුවකු ලෙස ලාභයෙන් 1/5 ලබා දී තරංගා බඳවා ගන්නා ලදී. ව්‍යාපාරයේ නව ලාභ ලාභ අනුපාතය වන්නේ,

(1) 3 : 2 : 1 කි.
(2) 5 : 3 : 2 කි.
(3) 12 : 8 : 5 කි.
(4) 2 : 2 : 1 කි.
(5) සම සමව බෙදා ගනී.

(24) හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වගන්තිය තුළ ඇතුලත් කරුණක් නොවන්නේ,

(1) ප්‍රාග්ධන පොළී හිමි වේ.
(2) ලාභ ලාභ සම සමව බෙදා ගැනීම.
(3) ප්‍රාග්ධනයට අමතරව සැපයූ ණය සඳහා 5% පොලියක් හිමි වීම.
(4) හවුල් කරුවකු දරනු ලැබූ ව්‍යාපාරයේ වියදම් නැවත ප්‍රතිපූර්ණය කළ යුතුයි.
(5) හවුල් කරුවකු බඳවා ගැනීමේදී සියලු හවුල් කරුවන්ගේ එකගත්වය පැවතිය යුතුයි.

(25) සාලිය හා අශෝක 3 : 2 අනුපාතයට ලාභ බෙදා ගත් හවුල් ව්‍යාපාරයට නව හවුල් කරුවකු ලෙස මාලා කැඳවා ගන්නා ලදී. එහිදී නව ලාභ ලාභ අනුපාතය 5 : 3 : 2 විය. මාලා බඳවා ගන්නා දින කීර්ති නාමය රු. 300 000 තක්සේරු කළ අතර එය ප්‍රාග්ධන ගිණුම මගින් ගැලපීමට එකග විය. කීර්ති නාමය ගිණුම් ගත කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

1)

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධන | A | 30 000 | |
| | B | 18 000 | |
| | C | 12 000 | |
| ප්‍රාග්ධන | | A | 36 000 |
| | | B | 24 000 |

2)

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන හර | A | 36 000 |
| හර | B | 24 000 |
| ප්‍රාග්ධන | A | 30 000 |
| | B | 18 000 |
| | C | 12 000 |

3)

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධන | A හර | 150 000 | |
| | B හර | 90 000 | |
| | C හර | 60 000 | |
| ප්‍රාග්ධන | C | | 300 000 |

4)

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධන හර | හර A | 180 000 | |
| හර | හර B | 120 000 | |
| ප්‍රාග්ධන | C | | 300 000 |

5)

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධන | හර A | 150 000 | |
| | හර B | 90 000 | |
| | හර C | 60 000 | |
| ප්‍රාග්ධන | A | | 180 000 |
| | B | | 120 000 |

(26) විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත සිදුකළ විකුණුම්වල වටිනාකම රු. 80 000 කි. මෙම භාණ්ඩ තොගයෙන් 75% ක් පමණ විකිණී ඇති අතර සියලුම තොග විකුණුම් ලෙස වාර්තා කර ඇත.
ව්‍යාපාරයේ විකුණුම් සිදුකරන්නේ පිරිවැය මත 25% ක ලාභයක් ලැබෙන පරිදිය.
මෙම වරද නිසා විකුණුම්වලට හා භාණ්ඩ තොගයට ඇතිවූ බලපෑම වනුයේ,
(1) විකුණුම් 20 000 ක් වැඩි තොගය 15 000 ක් අඩු
(2) විකුණුම් 80 000 ක් වැඩි තොග 60 000 ක් අඩු
(3) විකුණුම් 60 000 ක් වැඩි තොග 48 000 ක් අඩු
(4) විකුණුම් 60 000 ක් වැඩි තොග 60 000 ක් අඩු
(5) විකුණුම් 60 000 ක් වැඩි තොග 6 000 ක් අඩු

(27) 2015/04/01 දිනට ප්‍රචාරන ගාස්තු ගිණුමේ රු. 30 000 ක් හර ශේෂයක් පැවතුනි. වර්ෂය තුළදී නව ප්‍රචාරණ ගිවිසුමක් සඳහා තවත් රු. 150,000/- ක් 2015.10.01 වර්ෂ 3 ක තුළ දී ප්‍රචාරක ගිවිසුමක් සඳහා මුදල් ගෙවන ලදී.
2016/03/31 දිනෙන් අවසන් වර්ෂයේ,
ආදායම් ප්‍රකාශයට අයකළ යුතු ප්‍රචාරණ වියදම වන්නේ,
(1) රු. 150 000 (2) රු. 80 000 (3) රු. 30 000
(4) රු. 210 000 (5) රු. 120 000

(28) විකුණුම් වෙළඳසැලේ තොරතුරු කීපයක් පහත දැක්වේ.
විකුණුම් 100,000
විකුණුම් පිරිවැය මත 25% ලාභයක් ලැබෙන පරිදි භාණ්ඩ විකිණීම සිදුකරනු ලබයි.

| | |
|---|---|
| ආරම්භක තොගය | 25 000 |
| ගැනුම් | 90 000 |
| අවසන් තොගය | 30 000 |

කාලපරිච්ඡේදයේ සිදුවී ඇති තොග හානිය ගණනය කරන්න.
(1) රු. 15 000 (2) රු. 80 000 (3) රු. 5 000 (4) රු. 10 000 (5) රු. 6 000

(29) 2016/01/01 දිනට ණයගැති ශේෂ ලැයිස්තුව,

| | |
|---|---|
| නාමල් | 18 000 |
| සුමල් | 12 000 |
| රමල් | (5000) |

2016/1 මාසයේ කිසිදු මුදල් ලැබීමක් සිදු නොවිණි. පිළිවෙලින් නාමල්, සුමල් සහ රමල් ට රු. 32 000 ක්, රු. 28 000 හා රු. 25 000 ලෙස විකුණුම් සිදුකර ඇත.
2016/01/31 දිනට මුළු ණයගැති ශේෂය කොපමණ ද?
(1) රු. 90 000 (2) රු. 30 000 (3) 115 000
(4) රු. 110 000 (5) රු. 85 000

(30) ගයාන් ව්‍යාපාරයේ 2015/04/01 දිනට පැවති ලිබඩු ගිණුමේ ශේෂය රු. 360 000 ක් හා එදිනට ක්ෂය ප්‍රතිපාදන ගිණුමේ ශේෂය රු. 65 000 ක් විය.
2015/10/01 දින ව්‍යාපාරය විසින් රු. 80 000 ක් මෝටර් රථයක් ණයට මිලදී ගන්නා ලදී.
ව්‍යාපාරය ලිබඩු වාර්ෂිකව 10% බැගින් ක්ෂය කරනු ලබයි.
2016/03/31 අවසන් වර්ෂය සඳහා ක්ෂය සම්බන්ධයෙන් ආදායම් ප්‍රකාශය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ වාර්තා කළ යුතු නිවැරදි අගයන් වන්නේ,

| | ආදායම් ප්‍රකාශය | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය |
|---|---|---|
| (1) | 44 000 | 65 000 |
| (2) | 44 000 | 109 000 |
| (3) | 40 000 | 65 000 |
| (4) | 36 000 | 101 000 |
| (5) | 40 000 | 105 000 |

(31) ආදායම් වියදම් ගිණුම හා ලැබීම් ගෙවීම් ගිණුම අතර පවතින වෙනස්කම් දෙකක් දක්වන්න.

.............................................................................................................................................................

.............................................................................................................................................................

(32) තොග පිරිවැය මූලිකාංග දක්වන්න.

.............................................................................................................................................................

.............................................................................................................................................................

(33) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය / අසත්‍ය දැයි දක්වන්න.

(1) සියලු ජංගම නොවන වත්කම් LKAS අනුව ක්ෂය කරයි. ..............................

(2) කීර්ති නාමය රු. 60 000 ක් තක්සේරු කිරීම. ..............................

(3) අඩමාණ ණය වෙන් කිරීම. ..............................

(4) කාර්යාල උපකරණ ආදායම් ප්‍රකාශයෙන් ලියා හැරීම. ..............................

(34) පහත එකිනෙක ගැලපුමට අදාළ සංකල්පය දක්වන්න.

(1) ණයට විකුණුම් ..............................

(2) කීර්තිනාමය රු. 60 000 ක් තක්සේරු කිරීම. ..............................

(3) අඩමාණ ණය වෙන් කිරීම. ..............................

(4) කාර්යාල උපකරණ ආදායම් ප්‍රකාශයෙන් ලියා හැරීම. ..............................

(35) මානව සම්පත් ගිණුම්කරණය යන්න හඳුන්වන්න.

.............................................................................................................................................................

.............................................................................................................................................................

(36) ජංගම ගිණුම හා ප්‍රාග්ධන අතර පවතින වෙනස්කම් දෙකක් දක්වන්න.

.............................................................................................................................................................

.............................................................................................................................................................

(37) සංඛ ව්‍යාපාරයේ සිදුවූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයක් මගින් දක්වා ඇත.

| | | | | | |
|---|---|---|---|---|---|
| | වත්කම් | = | හිමකම | + | වගකීම් |
| (1) | 500 000 (තොගය) | | | + | 300 000 (ණයහිමි) |
| | 200 000 (මුදල්) | | | | |
| (2) | -195 000 (මුදල්) | | + 5000 | - | 300 000 (ණයහිමි) |

සිදුවී ඇති එකිනෙක ගනුදෙනුව විස්තර කරන්න.

.............................................................................................................................................................

.............................................................................................................................................................

(38) පහත වගුව සම්පූර්න කරන්න.

| ගිණුම | 2015/4/1 ශේෂය | ලාභලාභ ගිණුම | මුදල් ගෙවීම් | 2016/3/31 ශේෂය |
|---|---|---|---|---|
| ගෙවල් කුලි | 3400 (බැර) | 62 000 | ...................... | 5100 (හර) |
| ප්‍රචාරණය | 2800 (හර) | ...................... | 76300 | 2600 (බැර) |

(39) ජගත් ව්‍යාපාරයේ තොරතුරු පහත දැක්වේ.

2015/4/1 ශුද්ධ වත්කම් රු. 375 000

2015/3/31 ශුද්ධ වත්කම් රු. 460 000

**අමතර තොරතුරු :**

(1) වර්ෂය තුළදී අයිතිකරු සිදු කළ ගැනිලි රු. 35 000 කි. එය නිසි පරිදි ගිණුම්ගත වී ඇත.

(2) අයිතිකරු අමතර ප්‍රාග්ධනය ලෙස රු. 60 000 ක ඉඩමක් යොදවා ඇති අතර එය නිසි පරිදි ගිණුම්ගත වී ඇත.

(3) අයිතිකරු තම පෞද්ගලික මුදලින් ව්‍යාපාරයේ විදුලි බිල රු. 10 000 ක් ගෙවා ඇති අතර එය ගිණුම්ගත කර ඇත.

ව්‍යාපාරයේ 2015/16 වර්ෂයේ ලාභය දක්වන්න.

.....................................................................................................................................................

(40) ව්‍යාපාරය 2009/04/01 දින රු. 500 000 කට යන්ත්‍රයක් මිලදී ගන්නා ලදී. එහි සුන්බුන් අගය රු. 50 000 ක් විය. ව්‍යාපාරය 2015/04/01 දින එම යන්ත්‍ර රු. 70 000 කට විකුණන ලදී. ව්‍යාපාරය යන්ත්‍ර 20% බැගින් පිරිවැය මත ක්ෂය කරනු ලබයි.

මෙම ගනුදෙනුව අදාළ ලාභය හා අලාභය දක්වන්න.

.....................................................................................................................................................

(41) කැළුම් නිෂ්පාදන ව්‍යාපාරයේ 2015/16 වර්ෂයට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| ප්‍රාථමික පිරිවැය | රු. 160 000 |
| මුළු නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | රු. 250 000 |
| නොනිමි තොගයේ වැඩි වීම. | රු. 10 000 |

ව්‍යාපාරය වර්ෂය තුළ දී ඒකක 5000 ක් නිපදවා ඇති අතර පිරිවැය මත 20% ලාභයක් ලැබෙන පරිදි භාණ්ඩ විකුණයි.

**අවශ්‍ය වන්නේ** : ඒකකයක විකුණුම් මිල ගණනය කරන්න.

.....................................................................................................................................................

(42) ජගත් හා විශ්ව හවුල් ව්‍යාපාරයේ තොරතුරු පහත දැක්වේ.

(1) ජගත් විසින් ව්‍යාපාරයේ රක්ෂණ ගාස්තු රු. 12 000 තම පෞද්ගලික මුදලින් ගෙවා ඇත.

(2) ලාභ කොටස් රු. 50 000 ක් හා රු. 30 000 ක් ලබා දී ඇත.

**අවශ්‍ය වන්නේ** :

ඉහත ගනුදෙනුවලට අදාළ ජනල් සටහන් දක්වන්න.

.....................................................................................................................................................

.....................................................................................................................................................

(43) ජංගම නොවන වත්කම් හා ජංගම වත්කම් අතර පවතින වෙනස්කම් හතරක් දක්වන්න.

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

(44) නිෂ්පාදන ගිණුමක් පිළියෙල කිරීමේ අරමුණු හතරක් දක්වන්න.

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

(45) හවුල් ව්‍යාපාර ආඥා පනතේ පහත වගන්ති මගින් අදහස් වන්නේ කුමක් දැයි දක්වන්න.

42 වගන්තිය - ..........................................................................................

43 වගන්තිය - ..........................................................................................

(46) LKAS 16 ට අනුව දේපොළ පිරියත උපකරණ හඳුනා ගැනීමට ඉටුවිය යුතු කොන්දේසි තුනක් දක්වන්න.

- පහත ජංගම ගිණුම භාවිතා කොට ප්‍රශ්න අංක 47, 48 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**ජංගම ගිණුම**

| | සඳ | පිනි | දිය | | සඳ | පිනි | දිය |
|---|---|---|---|---|---|---|---|
| ශේෂය | | | 10 | ශේෂය | 80 | 60 | |
| හවුල් වේතන | 30 | 30 | 30 | ණයපොලී | | | 20 |
| | | | | ප්‍රාග්ධන පොලී | 50 | 30 | 20 |
| | | | | හවුල් වේතන | 60 | 60 | 60 |
| | | | | ලාභ කොටස් | 50 | 50 | 25 |
| ශේ / ප / ගෙ | 210 | 170 | 85 | | | | |
| | 240 | 200 | 125 | | 240 | 200 | 125 |
| | | | | ශේ / ප / ගෙ | 210 | 170 | 85 |

(47) සඳ, පිනි හා දිය හවුල් ව්‍යාපාරයේ හවුල් ගිවිසුමේ පැවති කොන්දේසි 02 ක් දක්වන්න.

(48) සඳ, පිනි හා දිය හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය ගණනය කරන්න.

The National e-learning portal for the General Education

- කුසල් ජනිත් හා පෙරේරා හවුල් ව්‍යාපාරයේ 2015/04/01 දින පැවති ශේෂයන් පහත දැක්වේ. එම තොරතුරු උපයෝගී කරගෙන ප්‍රශ්න අංක 49 හා 50 සඳහා පිළිතුරු සපයන්න.

2015/04/01 දින ශේෂයන්

| | ප්‍රාග්ධන ගිණුම | ජංගම ගිණුම | ණය ගිණුම |
|---|---|---|---|
| කුසල් | 300 000 | 100 000 | |
| ජනිත් | 200 000 | 45 000 | 150 000 |
| පෙරේරා | 150 000 | (10 000) | |

(49) කුසල් ජනිත් හා පෙරේරා හවුල් ව්‍යාපාරයේ හිමිකම් ප්‍රාග්ධනය ගණනය කරන්න.

(50) ඉහත පැවති ශේෂයන් උපයෝගී කරගෙන හවුල් ව්‍යාපාරයේ 2015/04/01 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ උද්ධෘතයන් නිරූපණය කරන්න.

***

270 A3-2 A4-2

ඩී.එස්. සේනානායක විද්‍යාලය කොළඹ 07.

**ඩී.එස්. සේනානායක විද්‍යාලය, කොළඹ 07.**

**D.S. Senanayake College, Colombo 07.**

**තුන්වන වාර ඇගයීම -2016**

**Third Term Test - 2016**

**12 ශ්‍රේණිය -**

**Grade 12**

# ගිණුම්කරණය - II

## Accounting - II

**පැය තුනයි.**
**Three hours**

- **පළමු හා දෙවන ප්‍රශ්න ඇතුළු ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) නාරද හා දිසා සම සමව ලාභ බෙදා ගනිමින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයට 2015/04/01 දින නව හවුල්කරුවෙකු ලෙස සේකර බඳවා ගන්නා ලදි. සේකරට ලාභයෙන් 1/5 ලබා දුන් අතර ඉතිරිය පැරණි අයිතියේ ප්‍රකාරව බෙදා ගැනීමට අන් හවුල්කරුවන් එකඟ විය.

2015/04/01 දිනට පැවති ශේෂයන් කිහිපයක් පහත පරිදි වේ.

| | | හර | බැර |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | නාරද | | 400 000 |
| | දිසා | | 300 000 |
| ජංගම ගිණුම් .. | නාරද | | 50 000 |
| | දිසා | 20 000 | |
| ණය ගිණුම | නාරද | | 200 000 |
| විසර්ජනයට පෙර ලාභය | | | 650 000 |

(a) ලාභය ගණනය කිරීමේ දී පහත වැරදි සිදුවී ඇති බව පරීක්ෂණ මගින් අනාවරණය විය.

(1) නාරද ගේ ණය සඳහා වාර්ෂිකව ගෙවිය යුතු පොලිය මෙතෙක් ගිණුම්ගත කර නොමැත.

(2) නාරද ට සහ දිසාට ගෙවනු ලැබූ හවුල් වේතන ව්‍යාපාරයේ වැටුප් ගිණුමට පිටපත් කර ඇත.

(3) දිසාට හිමි ගොඩනැගිල්ලක ව්‍යපාරය පවත්වාගෙන යන අතර ඒ සඳහා වාර්ෂිකව රු.120,000/- ක් ගෙවීමට එකඟ වී ඇති අතර එය 2015/01/01 සිට වාර්ෂිකව රු.180,000/-ක් එකඟ විය. ගොඩනැගිලි කුලි ලෙස ගිණුම්ගත කර ඇත්තේ ගෙවනු ලැබූ රු.120,000/- ක් පමණි.

(4) සේකර විසින් ගෙවනු ලැබූ ව්‍යාපාරික රක්ෂණ ගාස්තු රු. 20,000/- ක් ගිණුම්ගත කර නොමැත.

(5) 2015/10/01 දින රු.50,000/- ක ලිබඩු මිලදී ගෙන ඇති අතර එය ගැනුම් ගිණුමට පිටපත් කර තිබුණි. ව්‍යාපාරය ස්ථාවර වත්කම් 20% බැගින් වාර්ෂිකව ක්ෂය කරනු ලබයි.

(6) නාරද හා දිසා සිදුකළ රු.5000/- ක් හා රු.10,000/- ක් භාණ්ඩ ගැනිලි ගිණුම්ගත කර නොමැත.

(b) සේකර බඳවා ගත් දින පහත කරුණු සඳහා හවුල්කරුවන් එකඟ විය.

- සේකර ප්‍රාග්ධනය ලෙස රු. 200,000/- ක් ද ජංගම ගිණුම සඳහා රු. 50,000/- ක් ද රැගෙන ආ යුතුය.
- එදිනට කීර්තිනාමය 100,000 කට තක්සේරු කළ අතර එය ප්‍රාග්ධන ගිණුම මගින් ගැලපීම.
- සේකරගේ ප්‍රාග්ධනය සඳහා 10% පොලියක් හිමි වන අතර මාසිකව වේතන රු. 5000 හිමි වීම.
- 2015/03/31 නාරදගේ ණය ගිණුමෙන් රු. 100 000 ක් 3 : 2 අනුපාතයට ප්‍රාග්ධන හා ජංගම ගිණුම අතර බෙදා හැරීම.

(c) ගිණුම් ලිපිකරු විසින් පැරණි ගිවිසුමේ කොන්දේසි අනුව ප්‍රාග්ධන පොලි හා වේතන ගෙවීම සිදුකර ඇත. එම කොන්දේසි ඒ ආකාරයෙන්ම නව ගිවිසුමට ගැනීමට නාරද හා දිසා එකඟ විය.

(d) 2016/03/31 නාරද හා දිසාව අදාළ ප්‍රාග්ධන පොලී හා හවුල් වේතන පහත පරිදි වේ.

| | නාරද | දිසා |
|---|---|---|
| ගෙවූ ප්‍රාග්ධන පොලී | 25 000 | 25 000 |
| ගෙවිය යුතු ප්‍රාග්ධන පොලී | 15 000 | 5 000 |
| ගෙවූ හවුල් වේතන | 40 000 | 20 000 |
| ගෙවිය යුතු වේතන | 20 000 | 40 000 |

**අවශ්‍ය වන්නේ :**

(1) ලාභය නිවැරදි කිරීමට අදාළ ජනල් සටහන් (සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ.)

(2) 2016/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහාලාභය නිවැරදි කිරීමේ ප්‍රකාශය

(3) 2016/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය විසර්ජනය කර ගන්නා ආකාරය දැක්වෙන ප්‍රකාශය

(4) 2016/03/31 අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම්

(02) බිනුර ව්‍යාපාරය අත් බෑග් නිෂ්පාදනය කරන ව්‍යාපාරයකි. 2015 වර්ෂය සඳහා නිෂ්පාදනයට සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.

| | 2015/01/01 | 2015/12/31 |
|---|---|---|
| අමුද්‍රව්‍ය (රෙදි මීටර්) | 500 | 750 |
| නොනිමි (ඒකක) | 200 | 150 |
| නිමි (ඒකක 200) | 100 000 | ? |
| වර්ෂය තුළ දරනු ලැබූ පොදු කාර්යය පිරිවැය | | |
| කම්හල් සේවක වැටුප් | 160 000 | |
| යන්ත්‍ර ක්ෂය | 30 000 | |
| විදුලිය | 40 000 | |
| යන්ත්‍ර රක්ෂණය | 25 000 | |
| කර්මාන්ත ශාලා කුලී | 75 000 | |
| මුරකුරු වැටුප් | 20 000 | |
| නූල් | 80 000 | |
| කම්හල් සේවක සුභසාධක | 60 000 | |

**අමතර තොරතුරු :**

(1) සැපයුම්කරු සමග ඇති කර ගත් ගිවිසුමට අනුව 2014 වර්ෂයේ දී රෙදි මීටරයක් රු. 140/- බැගින් මිලදී ගත් අතර 2015 වර්ෂයේ දී රු. 150/- බැගින් මිලදී ගන්නා ලදී.

(2) 2015 වර්ෂය තුළදී රෙදි මීටර් 3000 ක් මිලදී ගත් අතර අමුද්‍රව්‍ය FIFO ක්‍රමයට නිකුත් කරන ලදී.

(3) වර්ෂය තුළදී නිමි භාණ්ඩ බවට පත් කළ ඒකක ගණන 1000 ක් විය. මෙහි පෙර වර්ෂයේ නොනිමි ඒකක ද පවතී. වර්ෂය තුළ ඒකක 950 ක් විකුණන ලදී.

(4) ව්‍යාපාර විසින් නොනිමි ඒකක සඳහා දරා ඇත්තේ සෘජු ද්‍රව්‍ය හා සෘජු ශ්‍රමය පමණි. නොනිමි තොග නිෂ්පාදන පිරිවැයට ගළපනු ලබයි.

(5) ඒකකයක් සඳහා යන සෘජු වියදම් පහත පරිදි විය.

- සෘජු ශ්‍රමය ඒකකයක් සඳහා රු. 200 කි.
- සෘජු වෙනත් නිමි ඒකකයක් සඳහා රු. 50 කි.

(6) ව්‍යාපාරය විසින් පිරිවැයට 20% ක් ලාභයක් ලැබෙන පරිදි භාණ්ඩ විකිණීම සිදුකරනු ලබයි.

(7) වර්ෂය තුළ දරනු ලැබූ නිෂ්පාදන නොවන පොදු කාර්යය පිරිවැය රු. 125 000 කි.

**අවශ්‍ය වන්නේ:**

(i) 2015/12/31 අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ගිණුම

(ii) 2015/12/31 අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

(03) සාරංග ව්‍යාපාරයේ 2016 ජනවාරි මස සිදුවූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයක් ස්වරූපයෙන් පහත දක්වා ඇත.

| | ලිබඩු | + | යන්ත්‍ර | + | තොගය | + | ලැබිය යුතු ගිණුම් | + | බැංකු | = | හිමිකම | + | බැංකු ණය | + | ගෙවිය යුතු ගිණුම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශේෂය | 200 000 | + | 150 000 | + | 120 000 | + | 90 000 | + | 70 000 | = | 380 000 | + | 200 000 | + | 50 000 |
| (1) | | | | + | 130 000 | | | | | | | | | + | 130 000 |
| (2) | | | a | | | | | - | 30 000 | | | | | | |
| (3) | | | | - | 60 000 | + | b | | | = | c | | | | |
| (4) | | | | | | | | | d | | e | - | 20 000 | | |
| (5) | | | | | | | | - | 3 000 | = | - 3 000 | | | | |
| (6) | | | | | | - | 2 000 | | | = | - 2 000 | | | | |
| (7) | | | | | | | | | | = | - 4 000 | | | + | 4 000 |
| (8) | f | | g | | | | | | | = | h | | | | |
| (9) | | | | | | | | | | = | + 50 000 | | | - | 50 000 |
| (10) | | | | + | 12 000 | | i | | | = | j | | | | |

**අමතර තොරතුරු :-**

- ව්‍යාපාරය සියලු ජංගම නොවන වත්කම් මිලදී ගන්නා ලද්දේ කාලපරිච්ඡේදයේ ආරම්භක දිනයේ දී ය.
- සියලු ජංගම නොවන වත්කම් වාර්ෂිකව 9% බැගින් ක්ෂය කරනු ලබයි.
- ව්‍යාපාරය සාමාන්‍ය විකුණුම් සිදු කරනුයේ විකුණුම් මිල මත 1/4 ක ලාභයක් ලැබෙන පරිදි ය.
- බැංකු ණය මත වාර්ෂිකව 6% ක පොලියක් ගෙවනු ලැබේ.
- ජනවාරි මස කඩ කාමර කුලී ගෙවන ලද්දේ පෙබරවාරි මත තුළදී ය.
- ගනුදෙනුකරුවන් විසින් භාණ්ඩ තොගයක් ආපසු එවා ඇත.

**අවශ්‍ය වන්නේ :**

(1) a සිට j දක්වා අගයන් ගණනය කරන්න.

(2) සිදුවිය හැකි එකිනෙක ගනුදෙනුව විස්තර කරන්න.

(3) ආදායම් ප්‍රකාශය මගින් ජනවාරි මස ලාභය ගණනය කරන්න.

(4) 2015/01/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(04) සුදත්ත ව්‍යාපාරයේ 2016 ජනවාරි මස පිළියෙල කළ බැංකු පොත පහත දක්වා ඇත. එය ව්‍යාපාරයට බඳවා ගත් නව ගිණුම් ලිපිකරු විසින් පිළියෙල කරන ලද්දකි.

**බැංකු පොත**

| | | | | | |
|---|---|---|---|---|---|
| ශේෂය | | 73 000 | චෙක් | 101 609 | 12 000 |
| මුදල් තැන්පතු | | 25 000 | චෙක් | 101 610 | 23 000 |
| චෙක් | 230 499 | 17 000 | චෙක් | 101 611 | 14 000 |
| චෙක් | 125 302 | 11 000 | චෙක් | 101 612 | 5 000 |
| චෙක් | 406 300 | 33 000 | චෙක් | 101 613 | 19 000 |
| මුදල් තැන්පතු | | 30 000 | චෙක් | 101 614 | 34 000 |
| චෙක් | 980 803 | 9 000 | චෙක් | 101 615 | 16 000 |
| චෙක් | 202 506 | 27 000 | චෙක් | 101 616 | 38 000 |
| | | | චෙක් | 101 617 | 10 000 |
| | | | ශේෂය ප/ගෙ | | 64 000 |
| | | 225 000 | | | 225 000 |
| ශේෂය ප/ගෙ | | 64 000 | | | |

ව්‍යාපාරයේ බැංකු ගිණුම් පරීක්ෂා කර බලා පහත තොරතුරු ඔබට සපයා ඇත.

(1) ගිණුම් ලිපිකරු විසින් විකුණුම් සඳහා ලද 125302 දරන චෙක්පත බැංකු පොතට වාර්තා කළ ද, ජනවාරි මස තුළදී එම චෙක්පත ව්‍යාපාරයේ චෙක්පත් ගොනුව තුළ තිබී හමුවී ඇත.

(2) ජනවාරි මස බැංකු ප්‍රකාශය මගින් ලබා ගත් තොරතුරු

| | | |
|---|---|---|
| **බැංකු ප්‍රකාශය හර වූ අයිතම** | | **රු :** |
| චෙක්පත් අංක. | 101 610 | 23 000 |
| | 101 611 | 14 000 |
| | 101 614 | 34 000 |
| | 101 615 | 16 000 |
| | 101 617 | 19 000 |
| | 101 607 | 13 000 |
| | 101 605 | 12 000 |
| | 230 499 | 17 000 |
| රක්ෂණ ගාස්තු | | 10 000 |
| බැංකු ගාස්තු | | 2 000 |
| චෙක්පොත් ගාස්තු | | 3 000 |
| **බැංකු ප්‍රකාශයට බැර වූ අයිතම** | | |
| මුදල් තැන්පතු | | 55 000 |
| චෙක්පත් තැන්පතු | 406 300 - | 33 000 |
| | 980 803 - | 9 000 |
| | 105 608 - | 15 000 |
| | 230 499 - | 17 000 |
| | 735 280 - | 22 000 |

(3) චෙක්පත් අංක. 105 608 යන චෙක්පත ගනුදෙනුකරුවෙකු වූ ජානක විසින් තැන්පත් කළ චෙක්පතකි.

(4) බැංකු ප්‍රකාශයෙහි 2016/01/01 දිනට පැවති අගය හා බැංකු පොතෙහි ශේෂය අතර වෙනසක් විය.

(5) බැංකු ප්‍රකාශයෙහි සඳහන් තොරතුරු නිවැරදිව උපුටා ගෙන ඇත.

**අවශ්‍ය වන්නේ :**

(අ) 2016/01/01 දිනට බැංකු ප්‍රකාශයෙහි පැවති ශේෂය

(ආ) 2016/01/31 මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි නිරූපණය කළ යුතු ශේෂය

(ඇ) 2016/01/31 බැංකු ප්‍රකාශයෙහි පැවති ශේෂය

(ඉ) ගිණුම් ලිපිකරු මගින් සිදුවී ඇති මඟ හැරීම් තුනක් දක්වන්න.

(05) (අ) නිශාන්ත ව්‍යාපාරය ආංශික තුලන ක්‍රමයට ලෙජරය පවත්වා ගෙන යනු ලබයි. එහිදී ගිණුම් තැබීමේ පහත දෝෂයන් සිදුවී ඇති බව අනාවරණය විය.

(1) රු. 600 බොල් ණය පොදු ලෙජරයට පිටපත් කර නොමැති අතර ණයගැති ගිණුමට පිටපත් වී ඇත.

(2) රු. 7600 ක විකුණුම් ඉන්වොයිසිය මග හැරී ඇත.

(3) රු. 10 000 කට මිලදී ගත් ලිබඩු පිටපත් කර තිබුනේ ගැනුම් ගිණුම තුළයි. ව්‍යාපාරය සියලු ස්ථාවර වත්කම් 10% බැගින් ක්ෂය කරනු ලබයි.

(4) ලද වට්ටම් රු. 800 පොදු ලෙජරයට පමණක් නිවැරදිව ගිණුම්ගත කර තිබුණි.

(5) ණයගැතියෙකුගෙන් ලැබිය යුතු රු.8000 ක් ඔහුට ගෙවිය යුතු මුදලකට හිලව් කිරීම ගිණුම්ගත කර නොමැත.

(6) අත්පිට විකුණුම් සඳහා ලද රු.15000 ක චෙක්පත ලැබීම් ජනලය තුළ ණයගැති ලැබීම් යටතේ දක්වා ඇත. මෙය ණයගැති ලෙජරය තුළ ගිණුම්ගත කර නොමැත.

(7) පසුගිය වර්ෂය තුළ කපා හල රු.2500 ක බොල්ණය මෙම වර්ෂය තුළදී ලැබී ඇත. එය පොදු ජනලය තුළ පමණක් වාර්තා කර ඇත.

(8) දුන් වට්ටම් රු. 1100 ක් ණයගැති ගිණුමට පිටපත් කර තිබුණේ රු.1000 ක් ලෙසය. එය පොදු ලෙජරයට නිවැරදිව පිටපත් කර ඇත.

**අවශ්‍ය වන්නේ :**

(අ) වැරදි නිවැරදි කිරීමට අදාළ ජනල් සටහන්

(ආ) ව්‍යාපාරය වර්ෂ අවසානයේ ගණනය කළ ලාභය රු. 102 000 ක් විය. ඉහත වැරදි නිවැරදි කළ පසු නිවැරදි ලාභය ගණනය කරන්න.

(ආ) සාගර ව්‍යාපාරයේ 2015 වර්ෂයට අදාළ තොගය සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

| කාණ්ඩය | අයිතමය | ගත්මිල | නිෂ්පාදන පොදු කාර්යය | අපේක්ෂිත විකුණුම් වියදම | අපේක්ෂිත විකුණුම් මිල |
|---|---|---|---|---|---|
| බිස්කට් | A | 10 500 | 6 700 | 1 800 | 19 300 |
| | B | 9 200 | 5 100 | 400 | 14 500 |
| | C | 38 300 | 17 300 | 6 100 | 60 300 |
| කේක් | P | 40 000 | 25 000 | 7 500 | 72 000 |
| | Q | 109 000 | 43 600 | 12 700 | 155 600 |
| | R | 52 000 | 16 900 | 3 500 | 68 600 |

**අවශ්‍ය වන්නේ :-**

(i) 2015/12/31 දිනට පහත එකිනෙක තත්ත්වයක් යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු තොග වටිනාකම

(1) අයිතම ක්‍රමය

(2) කාණ්ඩ ක්‍රමය

(ii) ඉහත එකිනෙක ක්‍රමයන් යටතේ තොග කපා හැරීමට අදාළ ජනල් සටහන් වෙන වෙනම දක්වන්න.

(ii) 2015/12/31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 120 000 ක් විය. එදිනට නිවැරදි ණයගැති පාලන ගිණුම දක්වන්න.

(06) (අ) චතුරංග ව්‍යාපාරයේ යන්ත්‍ර සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

| 2015/04/01 දිනට තොරතුරු | | | | |
|---|---|---|---|---|
| යන්ත්‍රය | මිලදී ගත් දිනය | පිරිවැය | සුන්බුන් අගය | ඵලදායී ජීව කාලය |
| MA 0025 | 2008/04/01 | 500 000 | 20 000 | 6 |
| MA 0026 | 2009/04/01 | 950 000 | 50 000 | 10 |
| MA 0027 | 2012/04/01 | 1000 000 | - | 8 |

(1) 2015/16 වර්ෂය තුළදී සිදුවූ ගනුදෙනු

| යන්ත්‍රය | දිනය | ගනුදෙනුව | ඵලදායී ජීව කාලය | වටිනාකම |
|---|---|---|---|---|
| MA 0028 | 2015/04/01 | මිලදී ගැනීම | 5 | 600 000 |
| MA 0025 | 2015/04/01 | විකිණීම | | 25 000 |
| MA 0029 | 2015/10/01 | මිලදී ගැනීම | 10 | 500 000 |

(2) 2015/04/01 දින MA 0026 දරණ යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය නැවත සලකා බලන අතර එය ඉදිරි වර්ෂ තුනකට සීමා වේ යැයි ඇස්තමේන්තු කරන ලදී.

(3) 2015/04/01 දින MA 0027 දරණ යන්ත්‍රයේ සුන්බුන් අගය රු. 25000 වේ යැයි තක්සේරු කරන ලදී.

**අවශ්‍ය වන්නේ :-**

(1) 2015/16 වර්ෂය සඳහා පහත ගිණුම්,

(i) යන්ත්‍ර ගිණුම

(ii) යන්ත්‍ර ක්ෂය ගිණුම

(iii) යන්ත්‍ර ක්ෂය වෙන් කිරීම් ගිණුම

(iv) යන්ත්‍ර ඉවත් කිරීම් ගිණුම

(2) 2014/03/31 දිනට හා 2015/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ උද්ධෘතයන්

(ආ) සුසන්ත ව්‍යාපාරය සතුව 2015/04/01 පැවති මෝටර් රථ වල වටිනාකම රු. 800,000 කි. එදිනට ක්ෂය ප්‍රතිපාදන ගිණුමේ ශේෂය රු. 260,000 කි. ව්‍යාපාරය රු. 300,000 ක පිරිවැය වූ 2012/04/01 මිලදී ගත් මෝටර් රථය රු. 250,000 කට 2015/04/01 දින නව මෝටර් රථයකට හුවමාරු කරන ලදී. තවද රු. 50,000 මුදලින් ද ගෙවන ලදී. මෝටර් රථවල ක්ෂය ප්‍රතිශතය 10% කි.

**අවශ්‍ය වන්නේ :-**

(1) මෝටර් රථ හුවමාරු කිරීමේ ලාභය

(2) මෝටර් රථ හුවමාරුවට අදාළ ජනල් සටහන්

(3) 2015/16 වර්ෂයට අදාළ මෝටර් රථ ක්ෂය

(07) කපිල ව්‍යාපාරය විධිමත්ව ගිණුම් පොත් පවත්වා නොගත් අතර තොරතුරු විමර්ශනය මගින් පහත කරුණු අනාවරණය විය.

| | 2016/03/31 | 2015/03/31 |
|---|---|---|
| ඉඩම් | 500 000 | 500 000 |
| ගොඩනැගිලි (ධාරණ අගය) | ? | 440 000 |
| ගොඩනැගිලි ක්ෂය වෙන් කිරීම් | ? | 160 000 |
| මෝටර් රථ තොගය (ධාරණ අගය) | 450 000 | 400 000 |
| තොගය (පිරිවැය) | 60 000 | 75 000 |
| යන්ත්‍ර (ධාරණ අගය) | ? | 250 000 |
| බැංකු ණය (10%) | 250 000 | 300 000 |
| ණයගැතියෝ | 120 000 | 80 000 |
| උපචිත විදුලිය | 5 000 | 4 000 |
| ලැබිය යුතු කුලී | 5 000 | ? |
| ණයහිමියෝ | 80 000 | 65 000 |
| ඉදිරියට කළ රක්ෂණ | 12 000 | 7 000 |
| මුදල් | ? | 95 000 |

**අමතර තොරතුරු :-**

**(1) මුදල් ලැබීම් ගනුදෙනු**

| | |
|---|---|
| ප්‍රාග්ධනය | 100 000 |
| කුලී ආදායම් | 35 000 |

**(2) මුදල් ගෙවීම් ගනුදෙනු**

| | |
|---|---|
| ණයහිමි ගෙවීම් | 565 000 |
| බැංකු ණය වාරික | 60 000 |
| මෝටර් රථ | 70 000 |
| විදුලිය | 17 000 |
| රක්ෂණය | 26 000 |
| සේවක වැටුප් | 65 000 |
| ගැනිලි | 10 000 |
| යන්ත්‍ර | 50 000 |
| ස්ථාවර තැන්පතු (10%) | 50 000 |
| දුරකථන ගාස්තු | 7 000 |

(3) 2016/03/31 දිනට තොගයේ පැවති පිරිවැය රු. 15000 ක තොගයෙහි ශුද්ධ උපලබ්ධි අගය රු. 10000 ක් යැයි ඇස්තමේන්තු කරන ලදී.

(4) ව්‍යාපාරය යන්ත්‍ර වාර්ෂිකව 5% ක් ද ගොඩනැගිලි 10% ක් ද හිනවන ක්ෂය ක්‍රමය මත ක්ෂය කරනු ලබයි.

(5) ණයගැතියන් මත රු.10000 ක බොල් ණය කපා හරින ලදී.

(6) දුන් වට්ටම් රු. 4000 ක් හා ලද වට්ටම් රු. 5000 ක් විය.

(7) ව්‍යාපාරය සාමාන්‍යයේ විකුණුම් සිදු කරනුයේ පිරිවැය මත 25% ක ලාභයක් ලැබෙන පරිදිය.

**අවශ්‍ය වන්නේ :-**

(අ) 2015/04/01 දිනට තත්ත්ව විස්තරය

(ආ) 2016/03/31 අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

(ඇ) 2016/03/31 දිනට මූල්‍ය ත්ත්ත්ව ප්‍රකාශය

***